**ශීර්ෂය 139 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.3,875,798,227ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.2,985,926,668 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු. 837,441,697 ක් හා රු. 52,429,862 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 25 ක් හා සියයට 10 ක් වූ ප්‍රමාණයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 597,023,570 | 2,746,949,657 | 576,025,003 | 1,930,506,527 | 20,998,567 | 816,443,130 |
| 290 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 448,625,000 | 83,200,000 | 443,144,638 | 36,250,500 | 5,480,362 | 46,949,500 |
| | එකතුව | 1,045,648,570 | 2,830,149,657 | 1,019,169,641 | 1,966,757,027 | 26,478,929 | 863,392,630 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ දෙකක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් විසින් පහත සඳහන් පරිදි එකතුව රු.145,527,020ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ලැබුණු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය (2012 දෙසැම්බර් 31දිනට) | ඉතිරිය පිළිබඳ නිරීක්ෂණය සංක්ෂිප්තව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 2,205,020 | 2,205,020 | - | - |

| | | | | |
|---|---|---|---|---|
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 143,275,000 | 119,443,000 | 23,832,000 | දිවි නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉතිරිව තිබූ රු.23,832,000 ක් එම අමාත්‍යාංශයේ දැනුම්දීම මත ආපසු යවා තිබුණි. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර | 47,000 | 22,000 | 25,000 | උපාධිධාරී පුහුණුවන්නන්ට වැටුප් ගෙවීම සඳහා ලබාදී තිබු මුදලෙන් ඉතිරි වූ මුදල් ආපසු යවා තිබුණි. |
| එකතුව | 145,527,020 | 121,670,020 | 23,857,000 | |

## 2.2 ආදායම් ගිණුම්

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය යටතේ වූ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය සඳහා ආදායම් සංකේත 01 ක් සඳහා රු.මිලියන 6 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර ආදායම් ලෙස රු.මිලියන 4.5ක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 75 ක ආදායමක් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන් දීමේ නිලධාරී | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | අඩුවෙන් එකතු කිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් | 10-03-07-06 | 6,000,000 | 4,504,500 | 1,495,500 | 25 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිමසීමාව | සත්‍ය | අවම සීමාව | සත්‍ය | උපරිමසීමාව | සත්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 139 | 13901 | 6,300,000 | 4,320,580 | 3,800,000 | 4,808,523 | 38,000,000 | 25,040,521 |
| 290 | 29001 | 19,000,000 | 10,164,627 | 14,000,000 | 18,296,101 | 112,000,000 | 70,221,494 |

## 2.4 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

**(අ) අග්‍රිම ගිණුම්**

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමේ රු.85,914,525 ක්වූ හර ශේෂ පැවතුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු. 49,044,907 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0051/0001 | 17,727,148 |
| | 6000/0000/00/0015/0051/0003 | 7,413,406 |
| | 6000/0000/00/0015/0051/0004 | 15,200,641 |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0145/000 | 7,701,287 |
| | 6000/0000/00/0006/0073/000 | 1,002,425 |
| එකතුව | | 49,044,907 |

**2 කොටස**

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

## 1. ශීර්ෂය 139 - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා,සැසදුම් ප්‍රකාශන පොත් පත්,ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 26 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්,විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය,මට ලැබී ඇති කාර්ය මණ්ඩලය ,අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසදුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසදුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්,වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්,රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම,පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම,ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 99 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) වැය විෂයයන් 10 ක් සඳහා ඌන ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන් ගෙන් ප්‍රතිපාදන මාරු කර ගැනීම සිදුවී තිබූ අතර, එය මුල් ඇස්තමේන්තුවලින් සියයට 24 සිට සියයට 152 දක්වා ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) අයවැය සහය සේවා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය යටතේ ලබාගත් ප්‍රතිපාදන

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ විසිතුරු මත්ස්‍ය වගාව සංවර්ධන ව්‍යාපෘතිය වැය විෂයය සඳහා මුදල් රෙගුලාසි 66 මඟින් රු. 14,000,000 ක් ද පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරිම් මඟින් රු.30,000,000 ක් ද වශයෙන් එකතුව රු.44,000,000ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණත් ඉන් රු. 29,997,210 ක් හෙවත් සියයට 68 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### (ඇ) අග්‍රිම ගිණුම

(i) 2012 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු නමුත් 2013 අප්‍රේල් 30 දින වන විටත් අමාත්‍යාංශය පියවා නොතිබුණු අග්‍රිම ශේෂවල එකතුව රු. 78,877,800 ක් විය.

(ii) මෙම අග්‍රිම ගිණුම් ශේෂය තුළ ලංකා ධීවර සංස්ථාවට මසුන් මිලට ගැනීම සහ වෙනත් දෛනික වියදම් සඳහා 2010 නොවැම්බර් 05 දින ලබා දී තිබූ රු.10,000,000 ක් වසර 02 ඉක්ම වූ නොපියවූ අත්තිකාරම් ශේෂයක්ද පැවතුණි.

(iii) 2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොත් අනුව අග්‍රිම ශේෂය රු.85,914,524 ක්වී තිබුණත් භාණ්ඩාගාර පොත් අනුව එය රු.85,402,341 ක් වී තිබුණි. ඒ අනුව රු.512,183 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

(i) 2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ පොත් අනුව තැන්පත් ගිණුමේ ශේෂය රු. 40,341,195 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු. 39,829,012 ක් වී තිබුණි. එම ශේෂ අතර රු. 512,183 ක් වූ වෙනස සම්බන්ධයෙන් සැසඳීම් කර නොතිබුණි.

(ii) භාවිතයෙන් ඉවත් කළ වාහන විකිණීමේදී ලබාගෙන තිබූ රු. 85,517 ක් වූ ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු රජයේ ආදායමට නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(ඉ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i) විෂය අංක 13901 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු හිඟහිටි ණය ශේෂවල එකතුව රු.2,199,409 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1.6 වගන්තිය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව 1987 සිට 1994 දක්වා වසර 25 ක් දක්වා කාලයක සිට පැවත එන ස්ථාන මාරු වී ගිය නිළධාරීන් 14 දෙනෙකුගෙන් අය විය යුතු රු.153,526 ක ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.8 වගන්තිය ප්‍රකාර නිලධාරියෙකුගේ ණය ශේෂ සියල්ලම ගෙවා අවසන් වනතුරු ඔහු රාජ්‍ය සංස්ථාවක සේවය සඳහා මුළුමනින්ම මුදා නොහැරිය යුතු අතර නිළධාරියා මුදාහැරීමට ප්‍රථම ඔහුගෙන් අය විය යුතු මුදල් අයකර ගැනීම ගැන ඔහු මුදා හරිනු ලබන දෙපාර්තමේන්තුව වගබලා ගත යුතු වුවද එම විධිවිධාන අනුව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී අත්තිකාරම් ගිණුමේ නිලධාරීන් 07 කට අදාලව අයවිය යුතු හිඟ ණය ශේෂ රු.295,627 ක් පැවතුණි.

(iv) ඉහත ණය ශේෂය තුළ ඇතුළත් සංස්ථා සේවය සඳහා මුදාහල නිලධාරීන් දෙදෙනෙකුට අදාල එකතුව රු.166,933 ක් වූ අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති ණය ශේෂයන් රු.235,598 ක් ලෙස ණයගැති ලේඛනයේ රු.68,664 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, නිලධාරීන් 03 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.66,845 ක් වූ ණය ශේෂයන්ට අදාල 2011 හා 2012 වර්ෂ තුළ අයවී නොතිබුණු වාරික අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(v) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.1 හා 4.2 වගන්ති ප්‍රකාරව විශ්‍රාම යාමට නියමිත නිළධාරීයා විශ්‍රාම යාමට ප්‍රථම ණය මුදල ආපසු අය කර ගැනීමට ඉඩ සලසනු වස් නිළධාරියාගේ කැමැත්ත පරිදි නියමිත වාරික ගණනට වඩා අඩු වාරික ගණනකින් ණය අය කර ගැනීමට හෝ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට හෝ කටයුතු නොකිරීම හේතුවෙන් 1985 සිට 2009 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය නිළධාරීන් 37 දෙනෙකුගෙන් අය විය යුතු රු.134,433 ක ණය ශේෂ හිඟහිටව පැවතුනි.

(vi) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය ප්‍රකාර ලබා ගත් ණය මුදල සම්පූර්ණයෙන් අය කර ගැනීමට පෙර නිළධාරියෙකු මිය ගියහොත් ඔහුගෙන් අය විය යුතුව තිබෙන සියලුම මුදල් ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට නියමිත මුදලකින් අඩු කර ගැනීම හෝ උරුමක්කාරයින්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණත් 1986 සිට 1995 දක්වා කාලය තුළ මිය ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අය විය යුතු රු.62,569 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4.1 සහ 4.5 උපවගන්තිවලට අනුව රජයට අයවිය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අය කර ගත නොහැකි අවස්ථාවලදී ඔහු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු යැයි නියම කර ඇති ක්‍රියාමාර්ග ඇපකරු සම්බන්ධයෙන් ද අනුගමනය කර ණය මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, වර්ෂ 27 ක කාලයක් තුළ අය නොවී ඉදිරියට ගෙන එමින් පවතින සේවය හැර ගිය නිළධාරීන් 24 දෙනෙකුගෙන් අය විය යුතු රු. 665,471 ක ණය ශේෂ සම්බන්ධයෙන් එම විධිවිධාන අනුව කටයුතු කර තිබුණි.

(viii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.1 වගන්තිය අනුව යම් නිළධාරියෙකුගේ සේවය අවසන් වෙතැයි සිතන අවස්ථාවලදී අඩු වාරික ගණනකින් එහි මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, 1994 හා 1995 වර්ෂවල අමාත්‍ය මණ්ඩල තීරණයක් මත සේවය අවසන් කර තිබූ අමාත්‍යවරයෙකුගේ පුද්ගලික ආරක්ෂක නිළධාරීන් 04 දෙනෙකුගෙන් අය විය යුතු රු.78,754 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ණය ශේෂයන් ඇප කරුවන්ගෙන් අයකර ගැනීම කෙරෙහිද අවධානය යොමුකර නොතිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

## 1.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍යාංශය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්,සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව 2013 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 1.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර එය 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු එම සැලැස්ම පරිදි ඉටු කර නොතිබුණි.

## 1.4.3 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබූ අතර එමඟින් වර්ෂය තුළ ඉටු කළ යුතු බවට අභ්‍යන්තර විගණන සැලැස්මේ ඇතුළත් කර තිබූ පරීක්ෂණ කාර්යයන් 22 න් කාර්යයන් 15 පමණක් ඉටුකර තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

### (අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශය සතු වාහන 07 ක් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබූ අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වාහන ලබා දී ඇති ආයතනය | වාහන සංඛ්‍යාව |
|---|---|
| ලංකා ධීවර සංස්ථාව | 03 |
| සී/ස සීනොර් පදනම | 03 |
| වයඹ පළාත් ප්‍රධාන ලේකම් | 01 |
| | 07 |

### (ආ) බේරුම් නොකළ බැරකම්

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ඒ යටතේ වූ අනෙකුත් ආයතනවල 2012 දෙසැම්බර් 31 දිනට එම වර්ෂයට අදාල බේරුම් නොකළ බැරකම් රු. 423,240,621 ක් විය.

**1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිමකළ විදේශාධාර ව්‍යාපෘති වලින් අරමුණු සාක්ෂාත් කරගැනිම හා ඒවායේ වත්කම් පැවරීම පිළිබඳ වාර්තා ඉදිරිපත් නොකිරිම.**

පහත සඳහන් විදේශාධාර ව්‍යාපෘති නිමකර තිබුණත්,එම ව්‍යාපෘති වලින් අපේක්ෂා කළ අරමුණු සාක්ෂාත් කර ගැනිම හා ව්‍යාපෘති සඳහා මිලදී ගෙන තිබුණු වත්කම් පැවරීම පිළිබඳ වාර්තා 2013 දෙසැම්බර් 31 දින වනවිටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ව්‍යාපෘතිය නිමකළ දිනය |
|---|---|
| සුනාමියෙන් විපතට පත් වූ ප්‍රදේශ යලි ගොඩ නැඟීමේ ව්‍යාපෘතිය | 2010.12.31 |
| වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය | 2009.06.30 |
| පශ්චාත් සුනාමි ජීවනෝපාය සහාය සහයෝගීතා වැඩසටහන | 2011.09.30 |

**(ආ) දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතිය**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලබේ.

(i) ව්‍යාපෘතියේ වාහන සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

- ව්‍යාපෘති අවසන් කිරීමේදී ඒවාට අයත් වත්කම් අදාල අමාත්‍යාංශ ලේකම් වෙත පැවරෙන නමුත් දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතියට අදාල වාහන 07 ක් රාජ්‍ය සමාගමක වැඩබලන සභාපතිවරයෙකු විසින් විධිමත් අධිකාර බලයකින් තොරව ආයතන අතර බෙදා දී තිබුණි.

- 2013 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ ප්‍රයෝජනය සඳහා මසකට රු.63,000 ක් බැගින් කුලී ගෙවමින් මෝටර් රථයක් කුලී පදනම මත ලබා ගෙන තිබුණි.
- ධීවර වරාය සඳහා මිලදී ගෙන තිබූ රු.4,240,000 ක් වටිනා ටොන් 5ක ට්‍රක් රථයේ හා රු.1,416,100 ක් වටිනා ඉන්ධන බවුසරයේ අයිතිය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සතු විය යුතු වුවත්, අදාල මීලදී ගැනීම් සිදු කළ රාජ්‍ය සමාගම එම රථවල හිමිකරු වශයෙන් සඳහන් කර ලියාපදිංචි කර තිබුණි.

(ii) ව්‍යාපෘති අරමුණෙන් බැහැරව කටයුතු කළ අවස්ථා අනාවරණය විය.

- දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතියේ කාර්යයෙන් බැහැර කාර්යයක් වූ රාජ්‍ය සමාගමකට අයත් මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනයේ තත්ත්වය උසස් කිරීම සඳහා අවස්ථා 08 ක දී ව්‍යාපෘති අරමුදල්වලින් රු. 34,059,911 ක් ලබා දී තිබුණි.
- එම බෝට්ටු අංගනය සඳහා වගකීමේ කාලයක් සහිතව මිලට ගෙන තිබූ රු.876,450 ක උපකරණ 13 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර රු.173,901 ක් වූ උපකරණ 02 ක් එම පරිශ්‍රය තුළ නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කටයුතු උපරිම ආර්ථිකභාවයෙන් යුතුව හා අවම පිරිවැයක් යටතේ සිදු කළ යුතු වුවත්, ව්‍යාපෘතියකට අදාල පහත සඳහන් මිලදී ගැනීම් කටයුතු රාජ්‍ය සමාගමක් මඟින් සිදු කර අදාල මිලදී ගැනීම්වල ඉන්වොයිසි වටිනාකමෙන් ආන්තිකයක් එම සමාගමට ලැබෙන පරිදි ගෙවීම් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **මිලදී ගත් වත්කම** | **ගෙවූ මුළු මුදල** | **ඉන්වොයිසි වටිනාකම** | **ආන්තිකය** |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| Matura Sur Composites France | 5,834,246 | 5,325,013 | 509,233 |
| උපකරණ කට්ටල | 838,953 | 803,100 | 35,853 |
| ට්‍රක් රථය | 4,452,000 | 4,240,000 | 212,000 |
| ට්‍රැක්ටරය | 1,486,905 | 1,416,100 | 70,805 |
| බවුසරය | 8,637,804 | 8,226,480 | 411,324 |
| | | | 1,239,215 |

මේ අනුව ඉහත රු. 1,239,214 ක් වූ ගෙවීම් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව හා විධිමත් අධිකාර බලයක් රහිතව සිදු කර තිබුණි.

(iv) ව්‍යාපෘතිය යටතේ ඉදිකර තිබුණු අයිස් නිෂ්පාදනාගාර සම්බන්ධයෙන් පහත අඩුපාඩු අනාවරණය විය.

- දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතියේ III අදියර යටතේ රු. 97,149,878 (වැට් රහිත) අගයකට ඉදි කර තිබූ අයිස් නිෂ්පාදනාගාර දෙකෙන් එක් නිෂ්පාදනාගාරයක බිමට යොදා තිබූ කොන්ක්‍රීට් තට්ටුවේ දෝෂ හේතුවෙන් එම නිෂ්පාදනාගාරය නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගත නොහැකිව තිබුණි.

- අයිස් නිෂ්පාදනාගාරයේ පැවති රු. 176,634 ක් වූ Booster Pump යන්ත්‍රයක් හා අයිස් සැකසුම් අංශයේ සවිකර තිබූ රු. 1,752,920 ක Hoist & Over Head Crane යන්ත්‍රයක් 2013 ජුනි මස සිට අක්‍රිය වී තිබුණ ද ඉදි කිරීම් කොන්ත්‍රාත්තුවේ වගකීම් කාලය තුළ අදාල කොන්ත්‍රාත්කරු ලවා එය යථාවත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.
- අයිස් නිෂ්පාදනාගාරයේ High bay light 10 ක් සවි කර තිබියදී එම ලාම්පු 24 ක් සවි කිරීම සඳහා වූ මුදල් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(v) ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමේ 1 වන අදියර යටතේ ඉදිකර තිබූ Off Loading Building - Export Oriented ගොඩනැඟිල්ල මෙහෙයුම් කටයුතු සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(vi) ව්‍යාපෘතිය යටතේ ඉදිකර තිබූ අපිරිසිදු ජලය ප්‍රතිචක්‍රීකරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය ඇණ හිට තිබූ අතර කොම්පෝස්ට් පොහොර සැකසීම සඳහා ඉදිකර තිබූ ගොඩනැඟිලි 03 ක් භාවිතයට නොගෙන ඌන උපයෝජිතව තිබුණි.

(vii) වරායේ පිවිසුම් මාර්ගය හා පාලම ඉදිකිරීම සඳහා ලැබී තිබූ යුරෝ 800,000 ක විදේශාධාර ප්‍රතිපාදනයෙන් පිවිසුම් මාර්ගය හා පාලම ඉදි කර තිබුණ ද පාලම ප්‍රධාන මාර්ගයට සම්බන්ධ කළ නොහැකි වීම හේතුවෙන් එම පාලම ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි.

(viii) දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතියේ මූලික අරමුණුවලින් බැහැරව රජයේ සමාගමකට එහි කටයුතු පවත්වාගෙන යාමට 2012 වර්ෂයේදී අවස්ථා 02 කදී රු. මිලියන 33 ක තාවකාලික අත්තිකාරම් ලබා තිබූ අතර මෙකී අත්තිකාරමෙන් රු.29,641,352 ක් 2013 දෙසැම්බර් 31 දින දක්වාම පියවා නොතිබුණි.

(ix) ව්‍යාපෘතියේ ආදායම් බදු බැදියාව සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු විය.

- ගිවිසුමට අනුව දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වූ Bam International B.V ආයතනයේ බදු බැදියාව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ගෙවිය යුතු වන අතර එම ආයතනයේ 2009 හා 2011 වර්ෂවලට අදාල ආදායම් බදු රු.61,042,145 ක් හා 2009 හා 2010 වර්ෂ වලට අදාල උපයන විට ගෙවීම් බදු මුදල රු.57,460,597 ක් අමාත්‍යාංශය විසින් ගෙවූ බවට තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

- ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව 2011 වර්ෂයේදී ඉදිරියට ගෙන එන ලද රු.30,000,000 ක ආදායම් බදු බැදියාවක් 2012 වර්ෂය අවසන් වන විට ද ගෙවා නොතිබූ බැවින් ඒ සඳහා දණ්ඩන මුදල් ගෙවීමේ අවදානමක් පැවතුණි.

(x) දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියේ ගිණුම් කටයුතු සඳහා ලෙජරයක් පවත්වා නොතිබූ අතර අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශේෂ පිරික්සුමක්ද පිළියෙල කර නොතිබුණි.

(xi) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ Travel lift යන්ත්‍රයක රු.3,998,891 ක් වූ රේගු ගාස්තු ප්‍රාග්ධනිත කර නොතිබුණි.

**1.7 කාර්යසාධනය**

2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු, සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැසුමට අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

2012 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලසුමේ ඇතුළත් වූ ධීවර සාමාජීය සංවර්ධන අංශය (FSDD) මගින් ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් 4 වර්ෂය තුළ ඉටු කර නොතිබුණි.

(i) ධීවර ජනතාව සඳහා දැනුවත් කිරීම් හා සංවර්ධන ක්‍රියාකාරකම්, නව මසුන් මැරීමේ තාක්ෂණය, පශ්චාත් අස්වනු, අළෙවිකරණ සහ ධීවර ප්‍රජාව සඳහා අළෙවිකරණ හා ව්‍යවසායකත්ව සංවර්ධනය

(ii) ධීවර ප්‍රජා සංවිධාන ආයතනිකව ශක්තිමත් කිරීම

(iii) ප්‍රජා පාදක මිරිදිය හා ජලජීවී වගා පරිචයන්

(iv) ධීවර තාක්ෂණ සහ ළමා සංවර්ධන වැඩසටහන

**(ආ) උපක්‍රමික කළමනාකරණ සැලැස්ම ස්ථාපනය කිරීම (Implementation of Strategic Management System)**

නිලධාරීන්ගේ කාර්ය පැවරීම් හා කාර්යසාධනය පරීක්ෂා කිරීම පිණිස අන්තර්ජාලගත කළමනාකරණ පද්ධතියක් (Web based Dash Board System) රු. මිලියන 5.65 ක වියදමින් ස්ථාපනය කර තිබුණි. අදාල උපදේශන කටයුතු සහ උපක්‍රමික සැලැස්ම ස්ථාපනය කිරීමේ කටයුතු සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට බැඳී අදියර 03 ක් සඳහා රු.මිලියන 3.65 ක් ගෙවා තිබුණි. විගණිත දින වන විට ද NAQDA ආයතනය හැර අනෙකුත් ආයතන සඳහා මෙම උපක්‍රමික සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**(අ) මච් යාත්‍රා 02 ක් මිලට ගැනීම**

(i) මච් යාත්‍රා 02 ක් මිලදී ගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2007 අගෝස්තු 15 දින ජාත්‍යන්තර සමාගමක් සමඟ කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. ඒ අනුව 2008 පෙබරවාරි 15 දින රු. මිලියන 326 ක් වූ මච් යාත්‍රා 02 ක් අමාත්‍යාංශය වෙත භාර දීමට නියමිතව තිබුණද, 2013 දෙසැම්බර් 31 දින වන විටත් අදාල කාර්යය ඉටුකර නොතිබුණි.

(ii) උක්ත කාර්ය සඳහා 2006 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා මහා භාණ්ඩාගාරයෙන් වෙන් කර තිබූ රු. 1,338,000,000 කින් මච් යාත්‍රා මිලට ගැනීමට අදාලව සංචලීකරණ අත්තිකාරම් ගෙවීම සහ ණයවර ලිපි විවෘත කිරීම ආදී කරුණු සඳහා රු. 110,903,138 ක් වැය කර තිබුණි. ඒ අනුව ඉතිරි වූ රු. 1,227,096,862 ක ප්‍රතිපාදනයෙන් රු. 541,018,038 ක් වෙනත් වැය විෂයයන්ගේ අවශ්‍යතා සඳහා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මාරු කර ගෙන වැය කර තිබුණි.

**(ආ) අස්ථානගත වවුචර්**

අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයට අදාල මුදල් රෙගුලාසි 272(2) අනුව කටයුතු නිම නොකළ රු.151,729 ක් වටිනා ගෙවීම් වවුචරයක් අස්ථානගත වී තිබුණි.

**1.9 අවිධිමත් ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු ඇතැම් ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) මිරිදිය ඔරු මිලදී ගැනීම**

(i) මිරිදිය සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ රු. 23,228,097 ක් වටිනාකමට මිරිදිය ඔරු 560 තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව මිලට ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුළත් වීමකින් තොරව රාජ්‍ය සමාගමකින් ඔරු මිලදී ගැනීමට තීරණය කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (1) මාර්ගෝපදේශයට පටහැනිව පිළිගත හැකි අත්තිකාරම් සුරක්ෂණයක් ලබා නොගෙන රු.10,949,240ක අත්තිකාරම් ගෙවා තිබුණි.

(ii) මිරිදිය ඔරු දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාලවලට ප්‍රවාහනය කිරීම සඳහා අනුමැතියකින් තොරව රු. 809,249 ක් රාජ්‍ය සමාගමක් වෙත ගෙවා තිබුණි. මිරිදිය ඔරු 560 ධීවර ප්‍රජාව වෙත බෙදා හැරිය බවට හෝ ඔවුන් භාර ගත් බව සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) බෝයා 03 ක් සවි කිරීම සඳහා අත්තිකාරම් ගෙවීම.**

ගාල්ල, කතලුව ධීවර තොටුපල අසල මුහුදේ මාර්ග බාධක තිබෙන ස්ථාන සලකුණු කිරීම සඳහා බෝයා 03 ක් සවි කිරීමට රාජ්‍ය සංස්ථාවකට ගෙවා තිබූ රු. 925,750 ක අත්තිකාරමින් රු.40,197 ක් නිරවුල් කර නොතිබූ අතර එම කාර්ය නිසි පරිදි සම්පූර්ණ කර ද නොතිබුණි.

**1.10 පාඩු හා හානි**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2012 වර්ෂය තුළදී අමාත්‍යාංශයේ වාහන 11 ක් අනතුරට භාජනය වී තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. එම වාහන සම්බන්ධ ලිපි ගොනු ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යන ලද පාඩු හා හානි ලේඛනය යාවත්කාලීන කර නොතිබූ අතර 2012 වර්ෂයේ එහි කිසිදු සටහනක් යොදා නොතිබුණි.

## 1.11 කළමනාකරණ දුර්වලතා

අමාත්‍යාංශයට අයත් වාහන 02 ක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර වසර 04 කට අධික කාලයක් තුළ නිෂ්කාර්යව ගාල්කර තිබුණි.

## 1.12 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 13 | 09 | - |
| (ii) තෘතීයික මට්ටම | 04 | 03 | 01 | - |
| (iii)ද්විතීයක මට්ටම | 106 | 63 | 43 | - |
| (iv)ප්‍රාථමික මට්ටම | 53 | 50 | 03 | - |
| (v) වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 02 | - | 01 |
| එකතුව | 186 | 131 | 56 | 01 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 56 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

### (ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

අමාත්‍යාංශය විසින් ප්‍රාථමික මට්ටමේ සේවකයන් දෙදෙනෙකු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ සේවය සඳහා 2010 ජූලි 08 දින සිට මුදා හැර තිබුණි.

**(ඇ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ගෙන් ලබා ගත් මානව සම්පත්**

අමාත්‍යාංශය විසින් රජයේ නීතිගත සංස්ථාවක ද්විතියික මට්ටමේ සේවකයෙකු 2009 අප්‍රේල් 07 දින සිට අමාත්‍යාංශ සේවය සඳහා අවිධිමත් ආකාරයට ලබා ගෙන තිබුණි.

## 2. ශිර්ෂය 290 - ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 30 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිර්ක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබි ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

වටිනාකම රු. 2,269,400 ක් වූ පරිගණක 18 ක් හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර 09 ක් 2010 දෙසැම්බර් 30 දින සිට 2012 අප්‍රේල් 26 දින දක්වා කාලය තුළදී මිලදී ගෙන තිබුණ ද 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව පරිගණක වත්කම් ලේඛනයක් පවත්වා නොතිබූ අතර චක්‍රලේඛයේ 03,04 හා 06 ඡේද ප්‍රකාරව ද කටයුතු කර නොතිබුණි.

### (ආ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 01ක් සඳහා සළසා තිබුණු රු. 3,200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 04ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 ත් සියයට 81 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීමට වැය විෂයය සඳහා සළසා තිබූ ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම නිසා රු. 3,000,000 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මාරු කර ගෙන තිබුණත්, ඉන් රු. 137,961 ක් හෙවත් සියයට 5 ක් පමණක් වැයකර තිබුණි.

(iv) වැය විෂයයන් 07 ක් සඳහා ඌන ප්‍රතිපාදන සළසා තිබීම නිසා මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වෙනත් වැය විෂයයන් ගෙන් ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණු අතර,එය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 44 සිට සියයට 150 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු. 749,138 ක් වූ තැන්පතු 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් රු. 38,179,185 ක් වැය ගිණුමට හර කර පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණත් ඒ සඳහා මුදල් රෙගුලාසි 215(3) හි විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**(ඇ) ආදායම් ගිණුම්**

(i) ස්වස්ථතා සහතික නිකුත් කිරීම, මත්ස්‍ය පිරිසැකසුම් මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, බෝට්ටු යාත්‍රාංගන ලියාපදිංචිය, මුහුදු කුඩැල්ලන් අපනයනය යන කාර්යයන් වෙනුවෙන් 2012 වර්ෂය සඳහා රු.6,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු.4,504,500ක් වී තිබූ අතර ඉකුත් වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුකර නොතිබියදී රැස්කළ ආදායම රු.4,951,420 ක්වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රැස් කළ ආදායම රු.424,620 ක් අඩුවී තිබුණි.

(ii) ආදායම් මූලාශ්‍ර අතර සිදු කරන ලද රු. 8,000 ක මාරු කිරීමක් ආදායම් ආපසු ගෙවීමක් ලෙස දක්වා තිබුණි.

(iii) බලපත්‍ර ගාස්තු අවුරුදු 05 කට වරක්වත් තක්සේරු කර සංශෝධනය කළ යුතු වුවත් , ධීවර මෙහෙයුම් කටයුතු සඳහා වූ වාර්ෂික බලපත්‍ර ගාස්තු එසේ සංශෝධනය කර නොතිබූ අතර 1996 වර්ෂයේ තීරණය කර තිබූ බලපත්‍ර ගාස්තුවම සමාලෝචිත වර්ෂයේදී ද අය කර තිබුණි.

**(ඉ) ත්‍යාග අරමුදල් ගිණුම**

1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන යටතේ ධීවරයින් විසින් මුහුදේදී කරනු ලබන වැරදි සම්බන්ධයෙන් අධිකරණයක නඩු පැවරීමටත්, රාජසන්තක කරන ලද මසුන් හා තහනම් නොවන භාණ්ඩ වෙන්දේසි කර ලැබෙන මුදල් ත්‍යාග අරමුදලට බැර කිරිමටත් එම මුදලින් වැටලිම්වලට සහභාගී වූ තැනැත්තන්ට ත්‍යාග මුදලක් ගෙවීමටත් අවශ්‍ය ප්‍රතිපාදන සළසා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආදායම් වශයෙන් රු.1,002,425ක් අරමුදලේ පැවතියද, වැටලීම්වලට සහභාගීවූවන්ට ත්‍යාග වශයෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළද ගෙවා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ මසුන් අලෙවියෙන් රැස්කර අධිකරණයේ තැන්පත් කරන ලද රු.117,580 ක ආදායම අධිකරණයෙන් ලබා ගෙන ත්‍යාග අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) අරමුදලේ ලැබීම් හා ලැබිය යුතු ආදායම් වෙන්ව හඳුනා ගත හැකි පරිදි පොත්පත් හා ලේඛන පවත්වා නොතිබුණි.

**(ඊ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i) විෂය අංක 29001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,624,991 ක්වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.1 හා 4.2 වගන්ති ප්‍රකාරව විශ්‍රාම යාමට නියමිත නිලධාරීයා විශ්‍රාම යාමට ප්‍රථම ණය මුදල ආපසු අය කර ගැනීමට ඉඩ සළසනු වස් නිලධාරියාගේ කැමැත්ත පරිදි නියමිත වාරික ගණනට වඩා අඩු වාරික ගණනකින් අය කර ගැනීමට හෝ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට හෝ කටයුතු නොකිරීම හේතුවෙන් විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 46,669 ක ණය ශේෂ හිඟහිටව පැවතුණි.

(iii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4.1 සහ 4.5 උප වගන්තිවලට අනුව රජයට අය විය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අය කර ගත නොහැකි අවස්ථාවලදී ඔහු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු යැයි නියම කොට ඇති ක්‍රියාමාර්ග ඇපකරු සම්බන්ධයෙන් ද අනුගමනය කර ණය මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, නිලධාරීන් 10 දෙනෙකුගෙන් අය කර ගත යුතු රු. 505,302 ක ණය ශේෂ සම්බන්ධයෙන් එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 අගෝස්තු 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.4.2 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

### (අ) බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.33,936,771 ක් විය. මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයකට සළසා තිබුණු රු.4, 750,000ක ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.1, 750,019 ක බැරකම් වලට එළඹ තිබුණි.

**(ආ) ස්ථාවර වත්කම්**

ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් දෙපාර්තමේන්තුවට පවරා තිබූ ජීප් රථයේ වටිනාකම සහ ජීප් රථය පවරා ගැනීමේදී ගෙවන ලද රේගු බදු රු.1,076,482 ක් වත්කම් ගිණුම් වලින් අත්හැර දමා තිබුණි.

## 2.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**දිස්ත්‍රික් ධීවර සමූපකාර සමිතිවල සාමාජිකයන් සඳහා චක්‍රීය ණය අරමුදල් ක්‍රමයක් ස්ථාපිත කිරීම**

දිස්ත්‍රික් ධීවර සමූපකාර සමිතිවල සාමාජිකයන්ට ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රීය ණය අරමුදල් ව්‍යාපෘති ක්‍රමයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2009,2010 වර්ෂවල දිස්ත්‍රික් සමූපකාර සමිති 07 කට රු. 4,050,000 ක් ලබා දී තිබුණි. මේ යටතේ ප්‍රතිලාභීන්ගෙන් ආපසු අය කරනු ලබන ණය වාරික නැවත ණය ලබාදීම සඳහා යෙදවිය යුතු වුවද, එසේ ණය ලබා නොදී දිස්ත්‍රික් සමූපකාර සමිති 5 කට අදාලව රු.2,416,563 ක මුදලක් ගිණුම්වල රඳවා ගෙන තිබූ අතර 2009 දෙසැම්බර් 10 දිනැති අංක 01/2009 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.2 ඡේදය අනුව සමූපකාර සමිති 07 මඟින් ණය ලබා දීම පිළිබඳව මාසික ප්‍රගති වාර්තා ඉදිරිපත් කර ද නොතිබුණි.

## 2.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

**දිවි නැගුම ධීවර පසු අස්වනු තාක්ෂණික ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය**

දිවි නැගුම ධීවර පසු අස්වනු තාක්ෂණික ණය යෝජනා ක්‍රමය චක්‍රීය ණය අරමුදලක් ලෙස ක්‍රියාත්මක කර තිබුණි. තාක්ෂණික ණය පදනමින් එක් ප්‍රතිලාභියෙකුට රු. 10,000 ක් ලබා දීම පිණිස ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබාදුන් මුදලින් 2012 ජූනි 12 දින රු. මිලියන 26.75 ක් ලංකා බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත්කර තිබුණි. මෙම තැන්පතුව සම්බන්ධයෙන් නිසි අධිකාර බලයක් නොතිබුණි. මුදල් රෙගුලාසි 382 ප්‍රකාරව තැන්පත් කරන ලද මුදල් වෙනුවෙන් තහවුරු සහතිකයක් බැංකුව විසින් ලබා දී නොතිබූ අතර එම මුදල සඳහා හිමි විය යුතු පොලී ආදායම් පිළිබඳ එකඟතාවයක් ද ලබාගෙන නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 48 | 25 | 23 |
| (ii) තෘතියික මට්ටම | 15 | 08 | 07 |
| (iii) ද්විතියක මට්ටම | 647 | 408 | 239 |
| (iv) ප්‍රාථමික මට්ටම | 107 | 95 | 12 |
| (v) වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| එකතුව | 818 | 537 | 281 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 281 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.